**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

**අවසාන වාර පරීක්ෂණය - 2011**

**කෘෂි හා ආහාර තාක්ෂණය - 10 ශ්‍රේණිය**

**කාලය :- පැය 02 යි**

## II කොටස

**පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(01) නාගරික පාසලක ඇති ගෙවත්තක ඉඩකඩ සීමිත බැවින් සැලසුම් කොට වගා කර ඇත. පෝච්චි වල වම්බටු, මිරිස්, තක්කාලි, බන්ඩක්කා සිටුවා වැට දිගේ දඹල වැල් යවා ඇත. වගා රාක්ක වල ඇති පීලි තුල කංකුන් හා ගොටුකොළ වැනි පලා වර්ග සිටුවා ඇත. වගා කුඩා වල පතෝල හා වැටකොළු වවා ඇත.

1. ඉහත ගෙවත්තේ ඇති බෝග කෘෂිකාර්මිකව වර්ගීකරණය කරන්න.
2. මෙම බෝග වලින් සොලනේසි කුලයට අයත් බෝග 2 ක් ලියන්න.
3. අනෙක් පස ඇති වැට ආවරණයකිරිමට වැවිය හැකි පලතුරු බෝගයක් ලියන්න.
4. මුලගැටිති දැකිය හැකි බෝගයක් ලියන්න. එහි වැදගත්කම ලියන්න.
5. මෙම ගෙවත්තේ පස සීමාකාරි සාධකයක් වේ. වගාව සඳහා පසේ අවශ්‍ය සාධක 2 ලියන්න.
6. පසට අමතරව බෝග වගාව සඳහා බලපාන වෙනත් පරිසර සාධකයක් ලියන්න.
7. ඉහත ද්‍රව්‍ය ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා යොදාගන්නා රෝපණ ද්‍රව්‍ය මොනවාද?
8. ශාඛ ප්‍රචාරණය කරන ප්‍රධාන ආකාර 2 මොනවාද? ඉහත රෝපණ ද්‍රව්‍ය අයත් වන ප්‍රචාරණ ක්‍රමය කුමක්ද?
9. පැලයක් සිටුවීම සඳහා බඳුනක් සකස් කරගන්නා අයුරු රූප සටහන් සහිතව විස්තර කරන්න.
10. ගෙවත්ත නඩත්තු කිරීමේදි ඉටුකළ යුතු ප්‍රධාන ක්‍රියා 2 ක් ලියන්න.

(02) මිරිස් වගාවක් සඳහා සුදුසු තවානක් පිළියෙල කිරීමට අවශ්‍යව ඇත.

1. මේ සඳහා සුදුසු තවාන් වර්ගය කුමක්ද?
2. තවාන් දමා පැල ලබාගෙන ක්ෂේත්‍රයේ සිටුවීමෙන් ඇතිවන වාසි 2 ක් ලියන්න.
3. තවාන් මාධ්‍ය සඳහා යොදගත් ද්‍රව්‍ය හා ඒවා මිශ්‍ර කරන ලද අනුපාතය කුමක්ද?
4. තවානක් දැමීමට ස්ථානයක් තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු 4 ක් ලියන්න.
5. තවාන් දමා සිටුවන වෙනත් බෝග 2 ක් නම් කරන්න.

(03) තක්කාලි විශාල වශයෙන් වගා කරන ගොවිමහතෙකු අස්වැන්න කොළඹ එවීමෙන් වැඩි ලාභයක් අපේක්ෂා කරයි. එය හොඳින් අසුරා කොළඹ එවුවද සිතූ තරම් ලාභයක් නොලැබිණි.

1. ඔහුට සිතූ තරම් ලාභයක් නොලැබීමට හේතුවූ කරුණු දෙකක් ලියන්න.
2. අස්වනු නෙලුපසු සිදුකරනු ලබන කාර්යයන් 4 ක් ලියන්න.
3. වැඩිපුර තක්කාලි කල්තබා ගැනීම සඳහා කල හැකි දේ මොනවාද?
4. බහුලව භාවිතා කරන ආහාර පරිරක්ෂණ ක්‍රම 2 ක් නම් කරන්න.
5. පැස්ටරීකරණය ලොවට හෙලිකල විද්‍යාඥයාගේ නම ලියන්න.

(04) අතු කැබැල්ලක් මුල් අද්දවා ගැනීමේ ක්‍රියාකාරකම සඳහා පහත ද්‍රව්‍ය හා උපකරණ සපයා තිබිණි. උපදෙස් පත්‍රිකාව සිසුන් ලබා දෙන ලදි.

| | |
|---|---|
| 20cm පළල පොලිතින් | කොම්පෝස්ට් |
| අත් ඉස් කෝප්පය | පිහියක් |
| හලාගත් මතු පිට පස් | නුල් / රබර් / කම්බි |
| දඩු කැබලි | |
| 50cm දිග කෝටු | |

1. මෙම ක්‍රියාවලියේදී පොලිතින් කැබැල්ල කපාගත යුතු අවම දිග කොපමණද?
2. මෙම ක්‍රමය මගින් මුල් අද්දවා ගැනීමට සකස් කරන ව්‍යුහය හඳුන්වන නම කුමක්ද?
3. එහි නම් කරන ලද රූප සටහනක් අඳින්න.
4. මාධ්‍ය මිශ්‍රණය සකස් කරගන්නේ කෙසේද?
5. දඩු කැබැල්ල සකස් කිරීමේදී සලකා බලන කරුණු 4 ක් ලියන්න.
6. මුල් ඇද්දවීම ඉක්මන් කිරීමට වෙළඳ පොලේ ඇති රසායනික හෝමෝන වර්ගයක් ලියන්න.

(05) වගාවක් සඳහා පසක් තෝරා ගැනීමේදි විවිධ ලක්ෂණ සලකා බලයි.

1. පාංශු වයනය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?
2. මැටි පසේ ලක්ෂණ දෙකක් ලියන්න.
3. පාංශු ජීවීන්ගෙන් පසට සිදුවන යහපත් බලපෑම් 3 ක් ලියන්න.
4. ජල වහනය සඳහා යොදාගන්නා කානු පද්ධතියක නම් කල රූපසටහනක් දක්වන්න.

(06) බණ්ඩාරවෙල ප්‍රදේශයේ ක්ෂේත්‍ර චාරිකාවක යෙදුනු සිසුන් පිරිසකට වගා බිම් වල පොලිතීන් වලින් සාදන ලද වගා ගෘහ දක්නට ලැබිණි. මේ පිළිබඳව ගුරුතුමියගෙන් විමසන ලදුව ඇය පැවසුයේ,

''බෝග වගාවට ප්‍රශස්ථ පරිසර තත්ව නොලැබෙන කාලවලදී පරිසර තත්ව පාලනය කිරීම සඳහා මෙවැනි වගා ගෘහ තුල බෝග වගා කටයුතු සිදුකරන බවයි.

1. බෝග වගාවට අවශ්‍ය පරිසර තත්ව 4 ක් ලියන්න.
2. පරිසර තත්ව පාලනය කිරීම සඳහා යොදා ගන්නා විවිධ ව්‍යුහ 4 ක් නම් කරන්න.
3. එම ව්‍යුහගත ගෘහ තුල බෝග වගා කිරීමෙන් ලබා ගත හැකි වාසි 4 ක් ලියන්න.
4. නිර්පාංශු වගාවේදී යොදා ගන්නා පෝෂක මිශ්‍රණ වල අඩංගු විය යුතු ගුණාංග 2 ක් ලියන්න.
5. ගණ මාධ්‍ය යොදා ගනිමින් වගා කරන විවිධ ක්‍රම 2 ක් ලියන්න.